# නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මී ඔය
# வதிவிட திட்ட முகாமையாளர் காரியாலையம் – மீ ஓய
# Resident Project Management Office – Mee Oya

**වාරිමාර්ග කළමනාකරණ අංශය**
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
**Irrigation Management Division**
**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
**Ministry of Irrigation & Water Resources Management**

මී ඔය
ගල්ගමුව
மீ ஓய
கல்கமுவ
Mee Oya
Galgamuwa


මගේ අංකය / எனது இல. / My Ref No — 018$5$ 2
ඔබේ අංකය / உமது இல. / Your Ref N
දිනය / திகதி' / Date — 2018 /04 /06

ව්‍යාපාර කළමනාකරණ කමිටු සාමාජික සියුම

රජයේ නිලධාරී මහතුන් හා සියුම ගොවි සංවිධාන

නියෝජිත වරුන් වෙත.

**<u>පෙර කන්න රැස්වීම් වාර්තාව</u>**

**<u>2018 අප්‍රේල් මාසය - උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය.</u>**

1994 අංක 13 දරණ සංශෝධන පණතේ 05 වන වගන්තියේ 05 වන උප වගන්තිය යටතේ උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය වෙනුවෙන් 2018 යල් කන්නය සඳහා පෙර වගා රැස්වීම 2018/04/06 දින 9.00 ට උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේදී පැවැත්වූ අතර එහිදී පළමුව ආගම සිහි කිරීමෙන් අනතුරුව පැමිණි සිටි සියුම රජයේ නිලධාරී මහතුන් හා සියුම ගොවි සංවිධාන නියෝජිත මහතුන් පිළිගැනීමෙන් පසුව න්‍යාය පත්‍රානුකූලව එදිනට නියමිත කටයුතු ආරම්භ කරන ලදී.

**<u>එදින සහභාගී වූවන්ගේ නාම ලේඛණය</u>**

| අනු අංකය | නම | ආයතනය/ ගොවි සංවිධානය |
|---|---|---|
| 01 | ඍගඑ.ඍගණ. දිසානායක | නේවාසික ව්‍යාපාර කළමනාකරු<br>මී-ඔය/උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය |
| 02 | ඍෘ.ඒ.නිහාල් රත්නායක | කෘෂිකර්ම උපදේශක-උස්ගල සියඹලන්ගමුව |
| 03 | ඍෘ.ණ.ධ.ජ.ඍෘ.වීරසූරිය | කෘෂිකර්ම උපදේශක-උස්ගල සියඹලන්ගමුව |
| 04 | ගඍගඛගඣගප්‍රේමචන්ද්‍ර | සංවර්ධන නිලධාරී- මී-ඔය/උස්ගල සියඹලන්ගමුව |
| 05 | ගගඪගඣගඅමරසිංහ | සංවර්ධන නිලධාරී- මී-ඔය/උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය |
| 06 | උ.ෘ.ඝ.ඛ.අබේවික්‍රම | ඉංජිනේරු සහකාර- පි.වා.ඉ. කාර්යාලය-ගල්ගමුව |
| 07 | ජ.ඒ.සෝමසිරිරත්න | ඩී 01 - ගොවි සංවිධානය - ගරු සභාපති. |
| 08 | ණ...චන්ද්‍රපාල | ඩී 01 - ගොවි සංවිධානය - ගරු ලේකම්. |
| 09 | ඔ.ඒ.ජයසේන | ඩී 01 - ගොවි සංවිධානය - ගරු භාණ්ඩාගාරික |
| 10 | ඍෘ.ඒ.රත්නායක | ඩී 01 - ගොවි සංවිධානය - ගරු නියෝජිත |
| 11 | ඍෘ.ඒ.ජයරත්න | ඩී 01 - ගොවි සංවිධානය - ගරු නියෝජිත |
| 12 | ඊ.ඒ.ජයවර්ධන | ඩී 02 - ගොවි සංවිධානය - ගරු සභාපති. |
| 13 | ..ඝ.ආරියරත්න | ඩී 02 - ගොවි සංවිධානය - ගරු ලේකම්. |

| | | |
|---|---|---|
| 15 | **සෑ.ඒ.**රෝහිණී රාජපක්ෂ | ඩී 03 - ගොවි සංවිධානය - ගරු ලේකම්. |
| 16 | **ඍගඑගසිරිසේන** | ඩී 04 - ගොවි සංවිධානය - ගරු භාණ්ඩාගාරික |
| 17 | **සෑ.ෑ.**ඥාණවංශ | සාලියරාජ ගොවි සංවිධානය - ගරු සභාපති. |
| 18 | **ඝ.ඵ.**ධම්මිකා කරුණාරත්න | සාලියරාජ ගොවි සංවිධානය - ගරු ලේකම්. |
| 19 | ..**ජ.**ගුණදාස | සාලියරාජ ගොවි සංවිධානය - ගරු භාණ්ඩාගාරික |
| 20 | **ෑ.ඵ.**චන්ද්‍රසේකර | යාය 05 ගොවි සංවිධානය - ගරු සභාපති. |

**<u>02.2017/18 මහ කන්නයේ සමාලෝචනය (නේවාසික ව්‍යාපාර කළමණාකරු)</u>**

2017/18 මහ කන්නයේ ව්‍යාපාරය තුළ කිසිදු වගාවක් සිදු නොවුණු අතර ඇතැම් ගොවීන් වෙනත් ජල පිහව උපයෝගී කරගෙන වෙනත් ආහාර බෝග වගාවන ඉතා සුලු පිමාණ වලින් සිදු කර තිබුණි.මුං වගා කිරීම සඳහා නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය සහ උස්ගල සියඹලන්ගමුව කෘෂිකර්ම උපදේශක කාර්යාලය මහත් උත්සාහයක් දැරූ නමුත් කාලගුණයේ අයහපත් බලපෑම් නිසා මෙම කටයුත්ත ව්‍යර්ථ වුණි.

**<u>02.1. වාරිමාර්ග කටයුතු ( ඉංජිනේරු සහකාර)</u>**

උස්ගල ව්‍යාපාරයේ වගාවක් පිහිටුවීම සම්බන්ධයෙන් ඉතා හදිසි තීරණයක් මෙම අවස්ථාවේ ගත නොහැකි වන අතර පවතින ජල තත්වය අනුව බෙත්ම වගාවක් පමණක් ආරම්භ කිරීමට හැකියාව ඇත. ඒ අනුව 2018 යල කන්නය සඳහා වගා සැලැස්මක් සකස් කර ගැනිම තුළින් ඉදිරි කන්නය ඉක්මනින් ආරම්භ කළ හැකි බවත් ප්‍රකාශ කරමින් අද වන විට ජලාශයේ ජල මට්ටම අඩි 10.6 ක් බවද ධාරිතාව අක්කර අඩි 7600 ක් බවද පැවසීය. ඒ අතුරින් ද මළ ධාරිතාවය ලෙස අක්කර අඩි 2000 ක් පමණ පවතින නිසා මේ පිළිබඳව ද අවධානය යොමු කළ යුතු වනු ඇත.

උස්ගල සියඹලන්ගමුව පෝෂිත ඇළ නඩත්තු කටයුතු අවසන් කර ඇති නමුත් ජලාශයට ජලය ලබා ගැනීම සම්බන්ධව ඉහළ ජලාධාර පෝෂක පිදේශ වල ගැටලුවක් පවතින බව පෙනී යයි.නමුත් මෙම ගැටලුව සම්බන්ධව මේ වන විටත් මහවැලි අධිකාරියේ අදාල ආයතන සමග සාකච්ඡා කර ඇත.

ඒත් සමග තම ආයතනයේ ඉදිරි වැඩසටහන් පහත පරිදි ඉදිරිපත් කරන ලදි.

- ➢ වම් ඉවුර පිධාන ඇළ නඩත්තු කටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇත
- ➢ එහි පැති බැම්මේ අබලන් ස්ථාන පුනරුත්තාපනයට කටයුතු යොදමින් පවතී
- ➢ ව්‍යාපාරයේ පවතින පිධාන මාර්ග වලද නඩත්තු කළ යුතු ස්ථාන හදුනාගෙන ඇත

කෙසේ වෙතත් මෙම කටයුතු සියල්ල සඳහා පිතිපාදන පිමාණවත් නොවන නිසා පිතිපාදන ලැබෙන ආකාරය අනුව නඩත්තු කටයුතු ඉටු කරනු ලැබේ.

| **ඉදිරිපත් කළ අය** | **ගැටලුව** | **විසඳුම** | **වගකීම** | **විසදුම අපේක්ෂා කරන කාලය** |
|---|---|---|---|---|
| යාය 05 ගරු සභාපති | වම් ඉවුරේ පිධාන ඇළෙහි ජල පාලනය අසීරු වීම | එම පිධාන ඇළෙහි ජල රොන් මඩ ඉවත් කිරීම. | වා.ඉ. /ඉ.ස | පිතිපාදන ලැබුණු පසු |
| **එම** | පෝෂිත ඇළෙහි සොරොවුව නීති විරෝධී ලෙස කඩා දමා තිබීම | නැවත නිර්මිතය සැකසීම. | වා.ඉ. /ඉ.ස | අදාල ආයතන සමග සාකච්ජා කර තීරණයත් ගත් පසු |

03.1. කෘෂිකර්මික කටයුතු (කෘෂිකර්ම උපදේශක )

පවතින කාලගුණ තත්වය අවබෝධයට ගෙන බෙත්ම වගාවක් සඳහා යොමු වීම ඉතා සුදුසු වන අතර මෙම තත්වය ද ගොවි සංවිධාන සියල්ල සාකච්ඡා කර තීරණ ගත යුතු එකක් වනු ඇත.වගාව සඳහා අවශ්‍ය වන බිත්තර වී සම්පූර්ණ පිමාණය නොවුණත් හැකි පමණින් ව්‍යාපාරයට ලබා දීමට උත්සාහ කරනු ලැබේ.

බිත්තර වී පිවර්ධනය කිරීම සඳහා ම වූ පදනම් බීජ යම් පිමාණයක් ( කි ග් 02 අසුරන )තම කාර්යාලය සතු පවතින බව ද දැනුම් දුනි.

ඉදිරියේ දී වෙනත් බෝග වගා කිරීමට ගොවීන් එතරම් කැමැත්තක් නොදක්වන නමුත් එසේ වගාවක් සඳහා යොමු වන අ යසඳහා රටකජු / මුං ඇට බීජ වශයෙන් 50% දායකත්වය මත ලබා දීමට අවස්ථාවක් ඇති බවට දැනුවත් කරන ලදි.

යන්ත්‍රානුසාරයෙන් පැළ සිටුවීම සඳහා යොමු වන ගොවීන් හට මෙම කටයුත්ත ඉතා ඵලදායි ලෙස ඉටත් කර ගැනීම වෙනුවෙන් පැළ සිටුවන යන්ති යොදා ගැනීමට අවස්ථාව පවතී.ව්‍යාපාරය සඳහා ලැබී තිබෙන යන්ති 02 උපයෝගී කරගෙන මෙම වාසිදායක තත්වය අත්පත් කර ගන්නා ලෙස කමිටුවට දැනුම් දුනි.

විසිරුම් වගා තාක්ෂණය සඳහා යොමු වන ගොවීන් සඳහා ද 50% දායකත්වය මත පැරෂුට් තැටි ලබා දීමට මෙවර අවස්ථාව ඇත.

05.සැපයුම් හා සේවා(ගොවිජන සේවා දෙපාර්තමේන්තුව )

- කමිටු නියෝජනයක් සිදු නොවුණි

2015/16 මහ කන්නය සඳහා පෙර වගා තීරණ

දින කිහිපයක් සිට උඩගල ව්‍යාපාරය සඳහා බෙත්ම වගාවක් ආරම්භ කිරීමට ගොවීන් උත්සාහ කරන අතර කාලගුණ තත්වයේ ද යම් යම් විවිධතාවන් කිහිපයක් දැකිය හැක.නමුත් පොදුවේ බලන කල පවතින මෙම ජල ධාරිතාවය බෙත්ම වගාවක් සඳහාද අතිරික්ත පිමාණයක් නොවන බව ආයතන වල අදහස වුණි.

නේවාසික ව්‍යාපාර කළමනාකරු - බෙත්ම වගාවක් සඳහා යොමු වීම මෙම අවස්ථාවේ ගොවීන්ට අස්වැසිල්ලක් වුව ද අතිශයින්ම මෙය ගැටලු රාශියක් උද්දීපනය කරන එකක් වනු ඇත.

වගාව සඳහා එක් ඉවුරක් භාවිතා කිරීම ගුණාත්මක වන අතර බල පිදේශ තීරණය කිරීම කුඹුරු බෙදා වෙන් කිරීම වැනි කටයුතු අද දින සාකච්ඡා කළ හැකි වුවත් නිශ්චිතවම ඒ පිලිබඳව ඉදිරි 11 දින පැවැත්වෙන වගා රැස්වීමේදී තීරණ ගත යුතු වේ.

ගොවි සංවිධාන වල අදහස් විමසීමෙන් අනතුරුව කිහිපයක් මේ සඳහා පූර්ණ කැමැත් පිකාශ කළ නමුත් ගොවි නායකයින් කිහිප පෙළක් ඒ සඳහා පූර්ණ කැමැත්ත පිකාශ නොකරන ලදි.

ඩී 01 ගොවි සංවිධානයේ ගරු සභාපති -ගොවීන්ගේ ද අදහස් විමසා බලා තවත් දින කිහිපයක් කාලගුණ තත්වය දෙස අවධානය යොමු කර වගාවක් සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු වේ.

සාලියරාජ ගොවි සංවිධානයේ ගරු සභාපති - තම ගොවි සංවිධානයේ ගොවීන් හට මෙම බෙත්ම වගා කිමයේ දී විශාල දුර පිමාණයක් ගමන් කිරීමට සිදු වන අතර මෙවන් ගැටලුකාරී තත්වයන් නිසාම ඉතා සුදුසු වන්නේ සාලියරාජ ගොවි සංවිධානය සඳහා බෙත්ම වගාව තම වම් ඉවුරට ලබා දීම යි.එසේ නොවුණහොත් මෙම ගොවි කණ්ඩායම මෙම වගා කන්නය සඳහා ඉදිරිපත් නොවන තත්වයක් ද දැකිය හැකි වන බව පෙන්වා දෙන ලදි.

යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති - ඉවුරු දෙකෙහිම වෙත්ම වගා කිරීමට යාම මගින් ගොවීන් අතර ගැටලු ඇතිවිය හැකි අතර ජලය අපතේ යාමටද මෙය සාධකයක් වේ.

ඩී 04 සහ ඩී 01 ගොවි සංවිධානයන් ද මෙම ගැටලු තත්වය නිසාම පිකාශ කරන ලද්දේ ගොවීන්ගේ ද අදහස් විමසා ඉදිරි දින කිහිපයේදී තීරණයක් ලබා දෙන බවයි.

ඉංජිනේරු සහකාර මහතා පෙන්වා දුන්නේ ස්ථාන කිහිපයක බෙත්ම වගාව ආරම්භ කිරීම මත විශාල ජල ධාරිතාවයක් අපතේ යා හැකි සේම මෙම තත්වයන් පාලනය කිරීමට ද පිමාණවත් කම්කරුවන් ද නොමැති බවයි.ඒ අනුව ගොවි සංවිධාන සියල්ල දකුණු ඉවුරෙහි පමණක් වගාවක් සඳහා යොමු වීම ඉතා යෝග්‍ය වනු ඇත.

අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකරු පෙන්වා දුන්නේ බෙත්ම වගාවක් සඳහා අදදින වගා කාල සටහන සකස් කිරීම අත්‍යවශය එකක්වන නිසා මූලිකව මෙම කටයුත්ත අවසන් කළ යුතු බවයි.ඉදිරියේදී වර්ෂාව ලැබී ජල ධාරිතාවය වැඩි වුවහොත් වැඩි අක්කර පිමාණයක් වගාවක් සඳහා යොමු වන බව පෙන්වා දුනි.

1994 අංක 13 දරණ සංශෝධන පණතේ 05 වන වගන්තියේ 05 වන උප වගන්තිය යටතේ උඩගල සියඹලන්ගමුව ව්‍යාපාරය වෙනුවෙන් 2018 යල් කන්නය සඳහා පහත පරිදි වගා කාල සටහන සකස් කර ගන්නා ලදි.

| අනු අංකය | විස්තරය | උස්ගල සියඹලන්ගමුව |
|---|---|---|
| 01 | වගා කිරීමට අපේක්ෂිත බෝග වර.ගය | වී මාස 2 1/2 / මාස 3 |
| 02 | වගා කිරීමට අපේක්ෂිත බිම් ප්‍රමාණය | අක්: 700 ද/ඉ |
| 03 | කුඹුරු බෙදා අවසන් කළ යුතු දිනය | 2018.04.12 |
| 03 | ගොවීන් විසින් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කල යුතු දිනය | 2018.04.20 ට පෙර |
| 04 | ගොවීන් විසින් නියමිත දිනට නඩත්තු නොකරනු ලැබූ ඇලවල් ගොවි සංවිධාන විසින් නඩත්තු කටයුතු අවසන් කල යුතු දිනය | ගොවි සංවිධාන මගින් ලේඛන සකස 'කර අවසන කුඹුරු බෙදා ගොවීන් හට ලබා දුන් පසු |
| 05 | වාරිමාර.ග දෙපාර.තමේන්තුව හා ගොවිසංවිධාන විසින් ප්‍රධාන ඇලවල්/බෙදුම් ඇලවල් නඩත්තු කටයුතු අවසන් කල යුතු දිනය | |
| 06 | බිම් සැකසීම ආරම්භ කලයුතු දිනය | 2018/04/25 ට පෙර |
| 07 | මුල් වරට ජලය නිකත් කිරීමට යොජිත දිනය | 2018/04/25 |
| 08 | වපුරා/බීජ සිටුවා අවසන් කල යුතු දිනය | 2018/05/10 |
| 09 | මුර ජලය ආරම්භ කරන දිනය | 2018/05/15 සිට |
| 10 | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2018/07/25 |
| 11 | ගවයින් යායෙන් ඉවත් කල යුතු දිනය | 2018/05/10 |
| 12 | වගා රක්‍ෂණය කර අවසන් කල යුතු දිනය | 2018/05/10 |
| 13 | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2018/07/25 |
| 14 | අස්වනු නෙලා අවසන් කලයුතු දිනය | 2018/08/10 |

❖ 1994 අංක13 දරන වාරිමාර්ග ( සංශෝධන ) පණතේ 11 වන උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත වගා රීති

- කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල්වල නඩත්තුව සඳහා කන්නයකට අක්කර 01 සඳහා රු.300.00 ක මුදලක් ගොවිසංවිධානයට ගෙවිය යුතුය.

- නියමිත දිනට කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල්වල තම කොටස නඩත්තු නොකරන අය ගෙන් මීටරයකට රු.150.00 ක මුදලක් ගොවිසංවිධානයට අය කළ හැකිය.

ඒ අනුව 2018 යල කන්නය සඳහා වු පෙර කන්න රැස්වීමේ දී ගනු ලැබු ඉහත තීරණ ඉතා සුදුසු බවට ඩී 02 ගොවි සංවිධානයේ ගරු ලේකම් ඒ එච් ආරියරත්න මහතා කළ යෝජනාව ඩී 03 ගොවි සංවිධානයේ ගරු ලේකම් ආර් එම් රෝහිණි රාජපක්ෂ මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

**06.වෙනත් ( නේවාසික ව්‍යාපාර කළමනාකරු)**

මෙම බෙත්ම වගාව සඳහා යොමු විමට සිදුව ඇත්තේ වැඩි අවධානමක් සමග යි.එම නිසා ජලය නිසි කළමනාකරණයකින් යුතුව පරිහරණය කිරීමට සියලු ගොවීන් කටයුතු කළ යුතු ය.වර්ෂාව ලැබීම පිමාණවත් තරමක පැවතියහොත් මෙම වගා කිමය වෙනස් කර වගා බල පිදේශය ඉහළ නැංවීමට හැකි වනු ඇත.

කර ඇති අතර එම ගැටලුව විසඳී උස්ගල ව්‍යාපාරයේ ගොවින් හට පෝෂිත ඇල හරහා ජලය ලබා ගැනීමට හැකි වන පරිදි මෙම තත්වය සමනය කිරීමට උත්සාහ කරනු ලැබේ.

ඉහත සඳහන් පරිදි සකස් කරගත් 2018 යල් කන්නයේ වගා සැලැස්ම අනුව ව්‍යාපාරයේ ඉදිරි කටයුතු සඳහා සූදානම් වන ලෙස සියලු ආයතන වලින් ඉල්ලීය. අවසාන වශයෙන් 2018 යල කන්නයේ වගා රැස්වීම ඉදිරි 11 දින සවස 02.00 ට මෙම කාර්යාලයේම පැවැත්වීමට නියමිත බව ද පිකාශ කරමින් සපැමිණි සියලු දෙනාට ද ස්තුතිය පුද කරමින් ප.ව. 05.00 ට පමණ පෙර කන්න රැස්වීම අවසන් කරන ලදි.

නේවාසික ව්‍යාපාර කළමනාකරු

මී-ඔය/උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය

ගල්ගමුව

පිටපත්

01.දිස්ත්‍රික් ලේකම්/දිසාපති, කුරුණෑගල :-කාරුණික දැන ගැනීම සඳහා

02.අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය කොළඹ :-කාරුණික දැන ගැනීම සඳහා

03.දිස්තික් වාරිමාර්ග අධ්‍යක්ෂ කුරුණෑගල :-කාරුණික දැන ගැනීම සඳහා

04.ප්‍රාදේශීය ලේකම්. ගල්ගමුව :-අ.ක.ස.

05.වාරිමාර්ග ඉංජිනේරු ගල්ගමුව :-අ.ක.ස.

06.ගොවිජන සං. නියෝජ්‍ය කොම.කුරුණෑගල :-අ.ක.ස.

07.සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ අ/පුර (අන්තර් පළාත්) :-අ.ක.ස.

08.ගොවිජන සං. නිලධාරී ගල්ගමුව :-අ.ක.ස.

09.කෘෂිකර්ම උපදේශක උ/සියඹලන්ගමුව :-අ.ක.ස.

10.සහකාර අධ්‍යක්ෂ කෘෂි රක්ෂණ මණ්ඩලය.මහව :-අ.ක.ස.

11.පොල් සංවර්ධන නිලධාරී- ගො.සේ.ම.-ගල්ගමුව :-කාරුණික දැන ගැනීම සඳහා